පුරවැසි අධ්‍යාපනය 10 ශ්‍රේණිය.

## කියවීම් පත්‍රිකාව.

### බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීම.

නූතන රාජ්‍ය තුළ දක්නට ලැබෙන බහුවිධතාව නිසා වර්තමාන රටවල් ගැටලු රැසකට මුහුණ දී තිබේ. ජාතික එකමුතුවක් පවත්වා ගෙන යාම, ජාතික ආරක්ෂාව සහතික කිරීම, සාමය පවත්වාගෙන යාම, කාර්යක්ෂම පාලනයක් ගෙන යාම, ජනතාව වැඩි වශයෙන් පාලනයට හවුල් කර ගැනීම, සංවර්ධනය වේගවත් කිරීම ද් අතර වේ. එම අවශ්‍යතා සපුරා ගැනීමට බලය බෙදා හැරීම හා බලය විමධ්‍යගත කිරීම වර්තමාන රාජ්‍යයන් විසින් යොදා ගනු ලබන ක්‍රමෝපායයන් ලෙස පෙන්වා දිය හැකිය.

**බලය**

රාජ්‍ය පාලන කටයුතු පවත්වා ගෙන යාම සඳහා රාජ්‍යයට ඇති හැකියාව බලයයි. එහි අවසාන හිමිකරුවා ජනතාව වන අතර ජනතාවට හිමි එම බලය පරමාධිපත්‍ය බලය ලෙස හඳුන්වයි. එම පරමාධිපත්‍ය බලයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් හා ඡන්ද බලය ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව තුළ දක්වා ඇත.

බලය විවිධ ස්වරූප වලින් පවතී. නම්.

* දේශපාලන බලය
* පරිපාලන බලය
* සමාජ බලය
* ආර්ථික බලය

## බලය විමධ්‍යගත කිරීම.

මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයකට ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම බලය විමධ්‍යගත කිරීම ලෙස හඳුන්වයි. එසේත් නැතිනම් මධ්‍යම ආණ්ඩුව එහි කේන්ද්‍රීය ආයතන තුළ සිට සැලසුම් , සම්පත් කළමනාකරණය සම්පත් සපයා ගැනීම හා බෙදා හැරීම පිළිබඳ වගකීම පහළ මට්ටමේ පරිපාලන ආයතනවලට , පළාත් ආණ්ඩුවලට අර්ධ ස්වාධීන රාජ්‍ය අධිකාරී හා සංස්ථා ආදී වශයෙන් පැවරීමක් සිදු කිරීම බලය විමධ්‍යගත කිරීමේදී සිදු කරයි

නිදසුන් :- 01

මධ්‍යම ආණ්ඩුවේ බලතල ක්‍රමය තුළ බලය විමධ්‍යගත කිරීම. එය ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා පහත පරිදි දැක්විය හැකිය.




02. මධ්‍යම ආණ්ඩුවේ කාර්යයන් ප්‍රාදේශීය පාලන ඒකක වෙත පවරා දීම.

* ඒ සඳහා ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පිහිටුවීම දැක්විය හැකිය.

- මහනගර සභා
- නගර සභා
- ප්‍රාදේශීය සභා.

03. රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයකට හෝ අධිකාරියකට අයත් බලය ප්‍රාදේශීය ඒකක වෙත පවරා දීම බලය විමධ්‍යගත කිරීමේ තවත් ස්වරූපයකි.

* ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.
* ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

කාර්යය පත්‍රිකාව.

01. "බලය" යනු කුමක් ද?

02. ජනතාව සතු 'බලය' කුමන නමකින් හඳුන්වනු ලබන්නේ ද?

03. එම ජනතාව සතු බලයට ඇතුළත් වන්නේ කුමන බලයන් ද?

04. ජනතාව සතු එම බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා-වේ කුමන ව්‍යවස්ථාව තුළ දැක්වේ ද?

05. බලයේ විවිධ ස්වරූප නම් කරන්න.

06. බලය විමධ්‍යගත කිරීම නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

07. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන නම් කරන්න.

*A. P. කාවින්‍යා කුමාරි නිර්මාණය.

*60 ක පිටපත්.